# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2106/36 - 2019 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2019.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KIDS/LND/01/ACQ/21.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උතුරු උඩ පත්තුවේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාටුවාගල ග්‍රාම නිලධාරි වසමේ රත්නපුර මිනුම් අධිකාරි විසින් පිළියෙල කළ අ.ග.පි. 325 අති. 24 පත්‍ර 24හි ලොට් 392 ඉඩම.

*මහජන කටයුක්ත කුමක්ද යන වග :*

හදිසි ආපදා හේතුවෙන් විපතට පත් වූවන්ට විකල්ප ඉඩම් ලබාදීම යටතේ හා ගම් පුළුල් කිරීම යටතේ ලබා දීමට.

*හිමිකම් කියන අය*: සී/ස බලංගොඩ වතු සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය වැවිලි සංස්ථාව; ප්‍රමාණය: හෙක්ටයාර් 4.4617.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.02.13 වැනි දින පෙ. ව. 10.00 ට කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019.01.30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජේ. එල්. සී. කීර්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කිරිඇල්ල.

2019 ජනවාරි මස 16 වැනි දින,
කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

02 - 144

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29281 - 22 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.